**මන්මුනෙයි ප්‍රාදේශීය සභාව**

**--------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විගණන ගාස්තු වෙනුවෙන් සඳහා ගෙවිය යුතු රු. 16,000 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1990 දී ඇති වූ යුදමය වාතාවරණය හේතුවෙන් විනාශ කරනු ලැබූ රු 165,500 ක් වටිනා වත්කම් ලේඛනවලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනයේ වත්කම්වල වටිනාකමට එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අලෙවි කරනු ලැබූ ස්ථාවර වත්කම්වල පොත් අගය වූ රු. 97,350 ක මුදල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදුලිය පරිභෝජනය කරන පුද්ගලයන්ගෙන් 1993 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.781 ,370 ක මුදල 2016 මැයි 20 වැනි දින දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට 1987 දෙසැම්බර 31 දින දක්වා ගෙවිය යුතු රු.1,958, 631 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ගෙවීමට කටයුතු නොකර තිබීමෙන් දිගටම මූල්‍ය ප්‍රකාශවල එය පෙන්නුම් කර තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.1,500,000 ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස ගිණුම්වල සඳහන් වුවත් එය සනාථ කිරීම සඳහා තැන්පතු සහතික ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය

| නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය I රීති 5 (12) | මුදල්, ගබඩා ද්‍රව්‍ය, චෙක්පත් අත්සන් කිරීම යනාදී කටයුතු නිලධාරීන් දෙදෙනෙකුට භාර දී තිබුණද, ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය X රීති 193 | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සන්සන්දනය කර විචලනයන් සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.13, 456, 670 කි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 4,371,982 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 9,084,688 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවකයන් නව දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අය කළ විශ්‍රාම වැටුප් දායක මුදල් සහ එම සේවකයන් වෙනුවෙන් සභාව විසින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් තොටස් මුදල් එකතුව රු 581,627 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මගින් 2008 වර්ෂයේ දී සභාවට පිරිනමන ලද මෝටර් රථ 05 ක හිමිකම් 2016 මැයි 20 දින දක්වා සභාවේ නමට මාරු කර නොතිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

USAID ආයතනය මගින් තරුණ පිරිස සවිමත් කිරීමේ වැඩසටහන සඳහා 2012 වර්ෂයේ දී පරිත්‍යාග කරන ලද රු.500, 000 ක වටිනාකමින් යුත් ශාරීරික අභ්‍යාස උපකරණ 2016 මැයි 20 දින දක්වා කාර්යාලයේ භාවිතයට නොගෙන තිබුණි.

## 4 පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය